විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 01/2017

මගේ අංකය : විවැ/චක්‍රලේඛ/01/2017

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව,

මාලිගාවත්ත,

කොළඹ 10.

2017.06.09

දිස්ත්‍රික් ලේකම්වරුන්,

ප්‍රාදේශීය ලේකම්වරුන්,

**ආබාධිත ත්‍රිවිධ හමුදා නිලධාරීන් හා වැන්දඹුවන්හට රණවිරු සුරැකුම් දීමනාව හිමිගැන්වීම.**

අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක අමප/16/0817/703/037- i හා 2016.12.13 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින්, රණවිරු සුරැකුම් දීමනාව පහත පරිදි හිමිගැන්වීමට තීරණය කර ඇත.

(i). ක්‍රියාන්විත රාජකාරියේදී ත්‍රස්තවාදි ක්‍රියා හේතුවෙන් ආබාධිත වු අංක අමප/1982/305/(9) හා 1982.07.21 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව වයස අවුරුදු 55 දක්වා වැටුප් හා දීමනා ලබාගන්නා ත්‍රිවිධ හමුදා නිලධාරීන්ට

(ii). ඉහත (i) හි වැටුප් හා දීමනා ලබා ගන්නා විවාහක රණවිරුවන්ගේ ඇවෑමෙන් ඔවුන්ගේ වැන්දඹු බිරින්දෑවරුන්ට,

(iii). ක්‍රියාන්විත රාජකාරියේදී ත්‍රස්තවාදි ක්‍රියා හේතුවෙන් මියගිය විවාහක රණවිරුන්ගේ, අමප/1982/305 (9) හා 1982.07.21 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ ප්‍රකාරව ප්‍රතිලාභ ලබන වැන්දඹු බිරින්දෑවරුන්ට

02. රණවිරු සුරැකුම් දීමනාව ගණනය කිරීම සඳහා වයස අවුරුදු 55 දී හිමිගන්වනු ලබන මූලික වැටුප සහ විශ්‍රාම වැටුප් ගණනය කිරීම සඳහා පාදක කරගනු ලබන දීමනා පමණක් සලකා බලනු ලැබේ. එලෙස ගණනය කරගත් වැටුපෙන් 85% ක ප්‍රතිශතය මත විශ්‍රාම වැටුපත්, 15% ක ප්‍රතිශතය මත වු රණවිරු සුරැකුම් දීමනාවත් වෙන් වෙන්ව ගණනය කිරීමට ඔබ විසින් කටයුතු කළ යුතුය.

03. මෙම දීමනාව විශ්‍රාම වැටුප සමඟ ස්ථාවර දීමනාවක් වශයෙන් වෙන්ව ගෙවිය යුතුය. අවුරුදු 55 න් පසුව සිදුවන විශ්‍රාම වැටුප් සංශෝධනයකදී මෙම දීමනාව සංශෝධනය කිරීමක් සිදු නොකළ යුතුය.එසේ වුවද යම් නිළධාරියෙකුට හිමි වැටුප් සංශෝධනයකදී මෙම දීමනාව සංශෝධනය විය යුතුය.

04.රණවිරු සුරැකුම් දීමනාව 15%ක උපරිම ප්‍රතිශතය තුළ රැඳී සිටිය යුතු අතර එක් එක් විශ්‍රාමිකයාට හිමි මූලික වැටුප හා විශ්‍රාම වැටුප ගණනයට අදාල දීමනා යන දෙකෙහි එකතුවෙන් 100% ප්‍රතිශතය නොඉක්මවිය යුතුය.

05. පාරිතෝෂික දීමනාව හා දුබලතා විශ්‍රාම වැටුප හිමිගැන්වීමේදී දැනට පවත්නා විධිවිධාන ඒ ආකාරයෙන්ම බල පැවැත්වේ.

06. විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 13/2010 අනුව 50%ක් හිමි විශ්‍රාමිකයන්ට මෙම දීමනාව හිමි නොවේ.

07. මෙම රණවිරු සුරැකුම් දීමනාව 2017.01.01 දින සිට ගෙවීමට කටයුතු කරනු ලැබේ.

08. මෙම චක්‍රලේඛය රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ සහ ආරක්ෂක අමාත්‍යාංශයේ එකඟතාවය මත නිකුත් කෙරේ.

**ඒ.ජගත් ඩී. ඩයස්**

විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

| | | |
|---|---|---|
| පිටපත:- | 01. ජනාධිපති ලේකම් | - කරු.දැ.ගැ.ස. |
| | 02. අග්‍රාමාත්‍ය ලේකම් | - කරු.දැ.ගැ.ස. |
| | 03. ලේකම් , රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය. | - කරු.දැ.ගැ.ස. |
| | 04. ලේකම් , ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | - කරු.දැ.ගැ.ස. |
| | 05. ලේකම්, මුදල් අමාත්‍යාංශය | - කරු.දැ.ගැ.ස. |
| | 06. ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශය | - අවශ්‍ය පරිදි ත්‍රිවිධ හමුදාවන් වෙත වැඩිදුර උපදෙස් නිකුත් කිරීම සඳහා. |
| | 07. ත්‍රිවිධ හමුදාධිපතිවරුන් | - කරු. අ.ක.ස |
| | 08. විගණකාධිපති | - කරු.දැ.ගැ.ස. |